CIVIL SOCIETY COLLECTIVE FOR COVID-19 RESPONSE

මාධ්‍ය නිවේදනය

2021 ජූලි මස 2 වනදා

**<u>සියල්ලන්ටම එන්නත් කිරීමේ සමානාත්මතාව: සියලු දෙනා සුරක්ෂිතවන තුරු, කිසිවෙකු ආරක්ෂිත නොවේ</u>**

**<u>කොවිඩ් 19 සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා වූ සිවිල් සමාජ සාමූහිකය සියල්ලන්ටම එන්නත් කිරීමේ සමානාත්මතාවය ඇතිකිරීම සඳහා අන්තර්ජාතික ප්‍රජාවගෙන් සහය ඉල්ලයි.</u>**

කෝවිඩ් 19 ව්‍යසනයට ප්‍රතිචාර දැක්වීම සඳහා වන ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සාමූහිකය සැමට එන්නත් කිරීමේ සමානාත්මතාවය තහවුරු කිරීමට ප්‍රමුඛතාවය දෙන ලෙස සියලු රටවලින් ඉල්ලා සිටී. ඵලදායී එන්නත් වැඩසටහනක් කළමනාකරණය කිරීම සඳහා ලොව පුරා එන්නත් බෙදාහදා ගැනීමට සහ පරිත්‍යාග කිරීමට එන්නත් සහ වෙනත් සම්පත් අතිරික්තයක් ඇති රටවලින් මෙම ඉල්ලීම සිදුකර ඇත.

ශ්‍රී ලංකා සිවිල් සමාජ සාමූහිකය විසින් කොළඹ පිහිටි විදේශ තානාපති කාර්යාල සහ ජාත්‍යන්තර සංවිධාන නියෝජිතයින්ට මෙම කරුණු ඇතුළත් ඉල්ලීමක් ලිපියක් මගින් දන්වා ඇත. මෙහි මූලිකවම අවධාරණය වී ඇත්තේ "සියල්ලන්ටම එන්නත් කිරීමේ සමානාත්මතාව: සියලු දෙනා සුරක්ෂිතවන තුරු, කිසිවෙකු ආරක්ෂිත නොවේ"යන්නයි.

සිවිල් සමාජ සාමූහිකය මෙම පණිවුඩය ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඉන්දියාව, ප්‍රංශය, ජර්මනිය, බංගලාදේශය, ඉතාලිය, ජපානය, මැලේසියාව, නෙදර්ලන්තය, නෝර්වේ, පාකිස්තානය, රුමේනියාව, රුසියාව, ස්විට්සර්ලන්තය, චීනය, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමයේ නියෝජිත කණ්ඩායම මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නේවාසික නියෝජිතයන් සමඟ හුවමාරු කරගෙන ඇත.

සාමූහිකය මෙහිදී අවධාරණය කර ඇත්තේ විද්‍යානුකූල අවශ්‍යතාවයන්ට සෑහෙන ආකාරයට ජනගහනය එන්නත් කිරීම සඳහා එන්නත් මාත්‍රාවන් ලබා දීමේ වැදගත්කමයි. මෙම ලිපියේ සඳහන් පරිදි මෙය පෙර නොවූ විරූ ගෝලීය අර්බුදයක් මිස සූරාකෑමට වාණිජ අවස්ථාවක් නොවේ. දැඩි බලපත්‍ර නීති සහ පේටන්ට් බලපත්‍ර ආරක්ෂා කිරීමකින් තොරව සැපයුම් හා බෙදාහැරීමේ දාම පුළුල් කිරීම තවත් රටවලට එන්නත් නිෂ්පාදනය කිරීමට අවස්ථාව ලබා දීම වැනි පියවරයන් මෙම වසංගත තත්වයෙන් මිදීම සඳහා අවශ්‍ය සාමූහික සහයෝගීතාවයේ අංගයන්ය.

එසේම සෞඛ්‍ය සඳහා මූලික මානව අයිතිය ආරක්ෂිත කිරීම මේ මොහොතේ ඉතා වැදගත් කාරණයක් වන බවත්, "එන්නත් රාජ්‍යතාන්ත්‍රිකරණ" ක්‍රියාවලිය හුදු උපායමාර්ගික, භූදේශපාලනික කේවල්කිරීම්වල කොටසක් විය නොයුතු බවද සාමූහිකය අවධාරණය කරයි. අතීතයේ දී වසූරිය හා පෝලියෝ රෝග තත්වයන්ගෙන් මිදීමට ගෝලීය වශයෙන් විශාල වශයෙන් එන්නත් ලබා දීමට කැපවී උත්සාහයෙන් කටයුතු කරඇති බවද මතක්කර ඇත. මෙම උත්සාහය ගෝලීය වසංගත ප්‍රතිචාර සඳහා බුද්ධිමය දේපල සීමා කිරීම් ප්‍රතිසංස්කරණ සමඟ ව්‍යුහාත්මක වෙනසක් ඉල්ලා සිටින අතර ගෝලීය වශයෙන් එන්නත් නිෂ්පාදනය සහතික කිරීම සඳහා තාක්ෂණය හා සම්පත් බෙදාගැනීම පුළුල් ලෙස භාවිතා කිරීම දිරිමත් කළ යුතු තත්වයකි. එසේම විදේශ එන්නත් පරිත්‍යාග සාදරයෙන් පිළිගන්නා අතර එය බෙහෙවින් අත්‍යාවශය වූවකි. නමුත් එය දිගු කාලීනව වසංගත ප්‍රතිචාර යාන්ත්‍රණයක් ලෙස ප්‍රමාණවත් නොවන බැවින් වඩා පුළුල් සහයෝගීතාවය ද සාමූහිකය මෙහිදී අවධාරණය කර ඇත.

ගෝලීය වශයෙන් මෙන්ම සැමට එන්නත්කිරීමේ සමානාත්මතාවය රට අභ්‍යන්තරවද තහවුරු කිරීම අත්‍යාවශය වූවකි. කෝවිඩ් 19 ප්‍රතිචාරය සඳහා වූ සිවිල් සමාජ සාමූහිකය අවධාරණය කරන පරිදි, එන්නත් කිරීමේ දී බලවතුන්ට වරප්‍රසාදිත අවස්ථා ලැබීම මෙන්ම එන්නත ලබා දීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතු සැලැස්මක් සහ සන්නිවේදන ක්‍රියාවලියකින් තොරව ක්‍රියාත්මක වේ. ද්වි-පාර්ශ්විකව හෝ ගෝලීය යාන්ත්‍රණය හරහා, ශ්‍රී ලංකාවට එන්නත් ලබාදීමට දායක වන විට ශ්‍රී ලංකා රජය සමඟ කරන සාකච්ඡාවලදී මෙම කරුණු මතු කරන ලෙසත්, විනිවිදභාවය සහ සමානාත්මතාවය ගැන ජාත්‍යන්තර ප්‍රජාව විසින් පිළිපැදිය යුතු මූලධර්මවලට අනුකූලව කටයුතු කිරීමට රජය දිරිමත් කරන ලෙසත් සාමූහිකය ඉල්ලා සිටී. (සෞඛ්‍ය අංශවල පෙරටුගාමී සේවකයින්ට, අත්‍යවශය සේවා, රෝගාබාධ ඇති අය කොරහි ප්‍රමුඛතාවය දීම ආදිය). ශ්‍රී ලංකා රජය විනිවිද පෙනෙන හා විද්‍යාත්මක එන්නත් කිරීමේ සැලැස්මක් පිළිපැදීම සහතික කිරීම සිදුකරගන්නා ලෙස ගෝලීය එන්නත් පරිත්‍යාග සඳහා පහසුකම් සපයන යුනිසෙෆ් සහ ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි එක්සත් ජාතීන්ගේ ආයතන තුලින් ද අපි අපේක්ෂා කරන බවද මෙම ලිපියේ තවදුරටත් සඳහන් වේ.

*The Civil Society Collective for COVID-19 Response is a collective of civil society organisations that have come together to contribute to the national COVID response efforts. The CSO collective primarily focusses on supporting most vulnerable groups affected by the pandemic with emergency food and hygiene materials. It also advocates on issues that affect these vulnerable groups during the pandemic. The CSO collective consists of 25 district representatives and 15 core group members at the national level coordinating the response of participating CSOs throughout the country. For any details you may contact csocollectivesl@gmail.com*

බොහෝ රටවල් ජීවනෝපායන්ට බලපාන ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටී. උපායමාර්ගික සංවර්ධන ආධාර සැපයීමේදී ද මෙය සැලකිල්ලට ගන්නා ලෙස   ඉල්ලා සිටිමු. ශ්‍රී ලංකාවේ ද බොහෝ කුටුම්භයන්ගේ ජීවනෝපායන්ට වසංගතය දැඩි ලෙස බලපා ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ දුප්පත් හා අවදානමට ලක්විය හැකි පවුල් සඳහා මානුෂීය කාරණයක් ලෙස ආහාර සහනාධාර ලබා දෙන ලෙස ද සාමූහිකය යොමු කළ මෙම ලිපියේ සඳහන් වේ.

කෝවිඩ් 19 ප්‍රතිචාරය සඳහා වූ සිවිල් සමාජ සාමූහිකය යනු ශ්‍රි ලංකාවේ ජාතික කෝවිඩ් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රයත්නයන් සඳහා සහයෝගය දැක්වීම සඳහා එකට එකතු වූ සිවිල් සමාජ සංවිධාන සමූහයකි. මෙම සාමූහිකය මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ වසංගතයෙන් පීඩාවට පත් වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට හදිසි ආහාර සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීමට සහාය වීම සඳහා ය. වසංගතය තුළ මෙම අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට බලපාන ගැටළු පිළිබඳව ද උපදෙස් ලබාදීමද සිදුකරයි. සිවිල් සමාජ සාමූහිකය දිවයින පුරා සහභාගී වන සිවිල් සමාජ සංවිධාන කොවිඩ් සඳහා දක්වන ප්‍රතිචාර සම්බන්ධීකරණය කරමින්, ජාතික මට්ටමින් දිස්ත්‍රික් නියෝජිතයින් 25 දෙනෙකුගෙන් සහ ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයින් 15 දෙනෙකුගෙන් සමන්විතව කටයුතු කරනු ලබයි.

*The Civil Society Collective for COVID-19 Response is a collective of civil society organisations that have come together to contribute to the national COVID response efforts. The CSO collective primarily focusses on supporting most vulnerable groups affected by the pandemic with emergency food and hygiene materials. It also advocates on issues that affect these vulnerable groups during the pandemic. The CSO collective consists of 25 district representatives and 15 core group members at the national level coordinating the response of participating CSOs throughout the country. For any details you may contact csocollectivesl@gmail.com*